# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 123/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 24/01/2024
පැය 0700

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම - වැලිකඩ පොලිස් වසම.

2024.01.24 වන දින විරෝධතාකරුවන් පිරිසක් වැලිකඩ පොලිස් වසමේ පොල්දූව වටරවුමේ සිට පාර්ලිමෙන්තු මාර්ගය ඔස්සේ එම මාර්ගය අවහිර කරමින් ගමන් කර පාර්ලිමෙන්තුවේ ප්‍රධාන දොරටුව අවහිර කරමින් සහ පාර්මේන්තුවට පිවිසිය හැකි ප්‍රධාන මාර්ග අවහිර කරමින් විරෝධතාවක් පැවැත්වීමට නියමිත බවට වැලිකඩ පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ ප්‍රධාන ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව කොළඹ ප්‍රධාන ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සදහන් වග උත්තරකරුවන් වන

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහ සහභාගී වන තවත් තැනැත්තන් වෙත,**

මාර්ගය භාවිතා කරන මහජනතාවට හා පදිකයින්ට අවහිර බාධා වන සේ කිසිම මාර්ගයක් හරස් කර හෝ ප්‍රචන්ඩක්‍රියා නොකිරීමටත්, මහජන නියෝජිතයින්ගේ පාර්ලිමේන්තු වරප්‍රසාදයන් අල්ලංගණය වන අයුරින් හා රාජකාරි යෙදි සිටින රාජ්‍ය නිලධාරින්ගේ රාජකාරි සඳහා කිසිදු බාධාවක් වන අයුරින් උද්ඝෝෂණ සිදු කිරිම තහනම් කරන අතර, කිසිදු පුද්ගලයෙකුට අවහිරයක් නොවන අන්දමින් මෙම උද්ඝෝෂණ සිදු වන බවට සියළු වගඋත්තර කරුවන් හා අනුගාමිකයින් වගබලා ගතයුතු. එසේ වගකීම් ගන්නට නොහැකිම් අදාල උද්ඝෝෂණය වගඋත්තරකරුවන් විසින් නොපමාව විසුරුවා හැරිය යුතුය. මෙම අණ කඩකලහොත් සාමය රකිනු වස් ශ්‍රී ලංකා පොලිසිය ඊට වහාම පියවර ගත යුතුය. යනුවෙන් ආඥාවක් නිකුත් කර ඇත.